# 'පට්ඨාන ධර්ම දේශනා මාලාව' පළමුවෙනි දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධස්ස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධස්ස

විචිත්ත මති ගම්භීර මනන්ත නය මණ්ඩිතං
පට්ඨානං සම්මසන්තස්ස විමලා මිත බුද්ධියා

යසස දෙහා නික්ඛමිංසු සුභා ඡබ්බණ්ණ රංසියො
නීල පීතා රත්ත සෙතා මඤ්ජිට්ඨා ච පභස්සරා

තං ලොකනාථං සුගතං ධම්මංච ජින සෙවිතං
සංඝං නිරඞ්ගණං සෙට්ඨං නමාමි සිරසාදරං

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට සංසාරයේ දීර්ඝ කාලයක් ප්‍රතිසන්ධි වශයෙන් චුති වශයෙන් සිත් දෙකකට මැදිව ඒ සිත් දෙක අතර පවතින්නාවූ කාල පරිච්ඡේදය තුල දීර්ඝ වශයෙන් කෙටි වශයෙන් විශාල පාරමී ධර්ම ශක්තියක් දියුණු කරගෙන සමථ භාවනා වැඩීම් වශයෙන් හිත දියුණු කරගෙන විදර්ශනා භාවනා වැඩීම වශයෙන් ප්‍රඥාව දියුණු කරගෙන සිහිය දියුණු කරගෙන දස පාරමී ධර්මයන්ම දියුණු කරගෙන වඩාගෙන ලොව්තුරා සම්මාසම්බුද්ධ රාජ්‍යට පත්වී වදාළ අනන්ත ගුණ ඇති සර්වඥ සම්මා සම්බුදු රජාණන්වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

ඒ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ සන්තානයෙහි පහළ වූ උන්වහන්සේගේ සන්තානයෙන් අවබෝධ කරගත්තාවූ ප්‍රඥාවෙන් අවබෝධ කර ගත්තාවූ ඒ උතුම් වූ ශ්‍රී සද්ධර්මරත්නයට මම නමස්කාර කරමි. මගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ධර්ම මාර්ගයෙහි ගමන් කොට නිර්වාන ධාතුවට ලං උනාවූ ආර්ය ධර්මයන් අවබෝධ කරගත්තාවු සුපටිපන්න ආදී ගුණයන්ගෙන් සමලංකෘත වූ උතුම් වූ මහා සංඝ රත්නයට මම නමස්කාර කරමි. මාගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයට ධම්ම රත්නයට සංඝ රත්නයට විතක්ෂණ මාත්‍රයකින් හෝ වේවා ගරු කිරීමෙන් වන්දනා කිරීමෙන් උපදින්නාවූ සියලු උතුම් කුසල ධර්මයන්ගේ අනුභාව බලයෙනුත් ඒ වන්දනාවට සුදුසු උනාවූ බුද්ධ රත්නය ධම්ම රත්නය සංඝ රත්නයේ අනන්ත වූ අපරිමාණ ගුණානුභාව බලයෙනුත්

මේ පිංවත් සැම දෙනාම මේ වන විට සිදුකරගත්තාවූ සියලුම සීල සමාධි ප්‍රඥා ගුණ ධර්මයන්ගේ ආනුභාව බලයෙනුත් මේ පින්වතුන් සැම දෙනාටම අද මේ කියල දෙන්න බලාපොරොත්තු වන්නාවූ ධර්මය කොටස ඉතාමත්ම හොඳින් තේරුම්ගන්ට සිහිය නුවණ යෝනිසෝමනසිකාරය සතිය සම්පජඤ්ඤය වැඩේවා! කියන ධර්ම කාරණයක් පාසා හොඳින් මෙනෙහි කරන්ටත් ශක්තිය ලැබේවා! ඒවගේම බණ ඇසීම ධර්මය සිතීම මෙනෙහි කිරීම ප්‍රතිපදාවක් උතුම් නිවනට යන්නාවූ මාර්ගයක් වේවා! නිකෙලෙස් සිතකින් ධර්මය මෙනෙහි කොට ඒ ධර්මය සන්තානයේ තැන්පත් කරගෙන මනසිකාරය පවත්වාගෙන ධර්මයට පවා නොඇලී නොබැඳී නිවනින් සැනසෙන්ට ලැබේවා! නිවන් පිණිස ඒකාන්තයෙන් මේ මාර්ගයක් ප්‍රතිපදාවක් වේවා! අද කියල දෙන්නාවූ ධර්මය සැම දෙනාටම හොඳින් වටහා ගන්න ලැබේවා! තේරේවා! කියල අපි පළමුකොටම මෛත්‍රීයෙන් ප්‍රර්ථනා කරනවා.

එසේ ප්‍රර්ථනා කරන ගමන්ම අද මේ පින්වතුන්ට කියල දෙන්ට බලාපොරොත්තු වන ධර්ම කාණ්ඩයට අයිති නමස්කාර පාඨයක් අපි ඉදිරිපත් කලා. ඒ නමස්කාර පාඨය ඒ ගාථාව අපි මෛත්‍රීයෙන් කියල දෙනවා. අපේ පින්වතුන් මේවගේ තියෙන්නාවූ තේරුමත් දැන් ගන්න. ගාථා ධර්ම කීපයක් අපි මාතෘකා කරා. ඒක නමස්කාර ගාථාවක්. මේ ගාථාවල තේරුමත් අපි පළමු කොට කියල දෙන්ට ඕනෑ.

**'විචිත්ත මති ගම්භීර මනන්ත නය මණ්ඩිතං' - 'විචිත්තං'** කියල කියන්නේ හරිම විසිතුරුයි අලංකාරයි පිවිතුරුයි.

**'අති ගම්භිරං'** = ඉතාමත්ම ගැඹුරුයි

**'මනන්ත නය'** = අනන්ත නය ක්‍රමයකින් සමන්නාගතයි

මෙන්න මේ නොයෙක් නය ක්‍රමයකින්, ඒ කියන්නේ නොයෙක් ක්‍රම වලින් යුක්ත වෙච්ච අති ගාම්භීර වූ විචිත්‍ර වූ ධර්ම කොට්ඨාශයක් ලොව්තුරා බුදුරාජාණන්වහන්සේ විමල වූ පිරිසිදු වූ ඥානයෙන් සම්මශ්‍රනය කළා. ඒ ධර්ම සම්මශ්‍රනයට ගොදුරු වෙච්ච ධර්මයට කියනවා පට්ඨාන ධර්මය කියල. **'පට්ඨානං සම්මසන්තස්ස විමලා මිත බුද්ධියා'** - ලොව්තුරා බුදුරාජාණන්වහන්සේ ඒ ධර්මය මෙනෙහි කරන අවස්ථාවේදී සම්මශ්‍රනය කරන අවස්ථාවේදී - **'යසස දෙහා නික්ඛමිංසු'** - උන්වහන්සේගේ ශරීරයෙන් අලංකාර ෂඩ්වර්ණ රශ්මියක් නිකුත් උනා = **'සුභා ඡබ්බණ්ණරංසියො'**

**'නීල පීතා රත්ත සෙතා මඤ්ජිට්ඨා ච පභස්සරා'** = නීල පීත ලෝහිත ඕදාත මාඤ්ජිෂ්ඨ ප්‍රභාෂ්වර කියන ෂඩ්වර්ණ සන රශ්මි මාලාවක් නිකුත් උනා. ඒතරම් ගාම්භිර වූ සූක්ෂමවූ ධර්ම කොට්ඨාසයක් මෙනෙහි කරන වෙලාවේ.

බුදුරජාණන්වහන්සේගේ හිත පිහිටුවන්න පුළුවන් හොඳම පරාසය තමයි ඒ පට්ඨාන ධර්මය නැතහොත් ඒ ගාම්භිර වූ ඒ අනන්ත නය ක්‍රමයෙන් යුක්ත වෙච්ච ඒ ධර්මය මනසිකාරය. ආන්න ඒ ධර්ම මනසිකාරය පැවැත්වූවා වූ ලෝක නාථයන් වහන්සේට, සුගතයන් වහන්සේට, උන්වහන්සේගේ ධර්මයට ඒ වාගේම ඒ ධර්මය සේවනය කලාවූ සංඝ රත්නයට සාදරයෙන් නමස්කාර කරමි = **'තං ලොක නාථං සුගතං ධම්මංච ජින සෙවිතං - සංඝං නිරඞ්ගණං සෙට්ඨං නමාමි සිරසාදරං'**

මේක තමයි ගාථාවේ තේරුම. මේක බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය වන්දනා කරන ගාථා ධර්මයක්. මේ ගාථාව මුලට තියා ගෙන මම මේ පින්වතුන්ට අද කියල දෙන්න බලාපොරොත්තු වන්නේ එක්තරා ධර්ම කාණ්ඩයක්. ඒ ධර්ම කාණ්ඩය තරමක් ගාම්භීර වෙන්න පුළුවන් නමුත් ඒක දැන ගත යුතුයි. ඒ ධර්ම කාණ්ඩය දැන ගැනීම ක්‍රමානුකූලව සිද්ධ වෙන්න ඕනැ. හදිස්සියට එහෙම කරන්න පුළුවන් කමක් නැහැ. මේ ධර්ම කාණ්ඩය කියල දෙන කොට එක ධර්ම කොට්ඨාසයකට අයිති කරුණු නැවත නැවත අහන්ට ඕන. නැවත නැවත පොත පතක් තියෙනවා නම් එයින් කියවන්න ඕනැ. සාකච්ඡා කරන්න ඕනැ. එහෙම නැතුව මේ මම අද කියල දෙන්නාවූ ධර්ම කාණ්ඩය එහෙම ලේසියෙන් තේරෙන්නේ නැ. නමුත් භය වෙන්ටත් හොඳ නැ. මහා මුහුදට ගියහම ඒ මහ මූදේ අයිනට වෙලා බලාගෙන හිටියහම ඒ මහ මුහුදේ රළ එනවා වැල්ල පැත්තට. වෙරළට එනවා. ඒ රළ වෙරළට එන එක කවදාවත්ම නවතින්නේ නැහැ. එකක් යනකොට එකක් එනවා. ඒ රළවල පුළුල් බව, වේගය, උස බව, ඒක හැදෙන තැන විවිධයි. ඒ වාගේම වෙනස් වෙනව. වෙනස් වෙනස් තැන් වලින් පටන් ගන්න, වෙනස් වෙච්ච උස් පහත් වලින් පවතින, ඒ වාගේම වෙරළට ආවත් ඒ මුහුදෙන් ඇති වෙන හැම රැල්ලක්ම වැල්ලට ඇවිල්ල එක තැනක එක ගානට නැවතිලා යන්නේ නැහැ. එක රැල්ලක් අවොත් එක ගානකට අනිත් රැල්ල තව ටිකක් ඉහළට යනවා නැත්තං අඩු වෙනවා. රළ කැරකෙන විදියත් ඒ විදියයි. සමහර ඒවා කැරකිලා යනවා සමහර ඒවා එහෙමම නිකම්ම තුනී වෙලා යනවා. ඔය විදියට තමයි තියෙන්නේ. ඒක නිසා මේ රළ ගෙඩි දෙකක් එක සමානව එන්නේ නැ. ඒවගේම තමයි ශබ්දය. ඒ නිසා මේ රළ පෙරළීම වෙනස් වෙනවා. කවදාවත්ම ඒක සමාන වෙන්නේ නැ. ඒවගේම රළේ තිබෙනවා අනන්ත ගතියක්. කෙළවරක් නැ. නවතින්නේ නැ. දිගින් දිගටම සිද්ධ වෙනවා. ඒ වගේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ඒ සර්වඥතාඥානය යම් කිසි ධර්ම මනසිකාරයක පිහිටියානම් ආන්න ඒ ධර්ම මනසිකාරය පිළිබඳව කථා කරන්ටයි අද මේ අලුත් අවුරුද්දේ 2017 මේ ධර්ම වැඩ සටහනින් අපි බලාපොරොත්තු වෙන්නේ.

අපේ පින්වත් කල්‍යාණ මිත්‍ර මහත්ම මහත්මීන් පිරිසක්ම අපෙන් ඉල්ලා සිටියා මේ වැඩේ අපිට කරලා දුන්නොත් හොඳයි කියල. ඒ තමයි **'පට්ඨාන ධර්ම'** පිළිබඳව යම්කිසි කරුණු ටිකක් කියල දෙන්න එහෙම නැත්නම් පට්ඨාන ධර්මය ඉගැන්වීම. ඉතිං මේක භාර දූර කාර්යයක්. නමුත් අපේ උපරිම උත්සාහය යොදල ලොව්තුරා බුදුරාජාණන් වහන්සේගේ සර්වඥතාඥානයට හැප්පිච්ච ධර්ම සාමාන්‍ය කෙනෙකුගේ මේ හිතකින් කියල දෙනවා කියල කියන්නේ ඒක මහා විසාල භාරදූර කාර්යයක්. නමුත් මම යම් යම් දේවල් මේ පින්වතුන්ට මතක් කරනවා විශේෂයෙන්ම දැන ගන්ට. ඒවා දන්නේ නැතුව මූලික කරුණු කාරණා දන්නේ නැතුව වැඩේට බහින්න බැහැ. ඉතිං මේ සමහර අවස්ථාවලදී මේ කරුණු කියන්ට ගිහිල්ලත් තැන් තැන් වලදී අඩාල උනේ අලුතින් මේකට සම්බන්ධ වෙන්නාවූ පිංවතුන්ගේ දැනුම හදන්න කියල ආපස්සට ආපස්සට ගියායින් පස්සේ ඉතිං අලුතෙන් අලුතෙන් අය එනකොට ඒ අලුත් අලුත් අයට නැවත නැවත පිහිට වෙන්න ගියාට පස්සේ අර දැනුම තියෙන වැඩෙන අයට ඒක repetition එකක් වෙනවා. ඉතිං ඒක නිසා ඒකෙනුත් වැලකී සිටින්න ඕනෑ. අපේ දහම් කොටස් අසා ගන්ට දැන ගන්ට කැමති පිංවතුන් පසුගිය දේවල් හොඳට නැවත නැවත අහල ඒවාගේම ඒවා පරිශීලනය කරලා කරුණු දැනගෙන මේ පසුව දේශනා කරන කොටස් අහගන්න කියල අපි මෛත්‍රීයෙන් මතක් කරනවා.

මේ **'පට්ඨාන'** කියන වචනය ධර්ම කොටසේ මහා ගාම්භීර වචනයක්. **'පට්ඨාන'** යන වචනය හොඳට තේරුම් ගන්න. මේ අවුරුද්දේ අපි ලැබෙන ලැබෙන සෑම අවස්ථාවකදීම මේ කොටස් කියනවා. වෙන ධර්ම කොටස් සමහර වෙලාවට අතපත ගහන්නේ නැති වෙන්නත් පුළුවන්. අපේ පිංවතුනුත් අපේ අලුතින් සහභාගී වෙන්නාවූ පිංවතුනුත් මේක සිහියේ තබාගෙන මේකට එකතු වෙන්න.

වචනයක් ප්‍රකාශ කරනවා, ඒ වචනය අපි කියල දෙනවා **'පට්ඨාන'** කියල. මේක පාලි වචනයක්. පාලි භාෂාවෙන් තිබෙන්නාවූ මේ **'පට්ඨාන'** කියන වචනයට තේරුම් කීපයක් සලසලා දීල තියෙනවා. අපි ඉස්සරවෙලාම ඒක තේරුම් ගනිමු. **'පට්ඨාන'** කියන වචනයට එක තේරුමක් තියෙනවා 'නොයෙක් ප්‍රත්‍යයන් එකතුවෙලා හැදෙනවා' කියන එක. නොයෙක් ප්‍රත්‍යයන්ගෙන් හේතුවන කරුණු, උපකාරක කරුණු , එකතුවෙලා හැදෙනවා කියන එක. ඔන්න එක අර්ථයක්.

ඊළගට තව ඒකට අපිට ලබා ගන්න පුළුවන් එක තේරුමක් තිබෙනවා. ඔය කුසල අකුසල ආදී ධර්ම තිබෙනවානේ, ඒ කුසල අකුසල ධර්මයන් මේ හේතු

වශයෙන්, ප්‍රත්‍යය  වශයෙන්, කොටස් වශයෙන්, විපාක වශයෙන් බෙදල බෙදල දක්වන විදියට, ඒකටත් කියනවා **'පට්ඨාන'** ක්‍රමය කියල.

අනිත් එක කියනවා ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ සර්වඥතාඥානය, ඒක මහා විසාල වෙච්ච පිරිසිඳු වෙච්ච පෘතුල අති ගාම්භීර ඥානයක්. ඒ සර්වඥතාඥානයට ගැලපෙන්ට කැමති විදියට උන්වහන්සේට ඒ සර්වඥතාඥානයට හසුරුවන්ට අරමුණු කරන්ට සර්වඥතාඥානයට හොඳට දැනෙන්ට හොඳට හසුරුවන්ට පුළුවන් ධර්ම පරාසයක් තියෙනවා ඒක තමයි **'පට්ඨානය'.**

සමහර වෙලාවට තියෙනවා මෙහෙම එකක්. ප්‍රධාන ධර්මය කියන එකටත් කියනවා 'පට්ඨානය' කියල. හැබැයි මෙතනට ගැලපෙන්නේ 'පට්ඨානය' කියන එකේ නොයෙන් අර්ථ එහෙම නැත්නම් නොයෙක් හේතු ප්‍රත්‍යය ධර්මයන්ගෙන් හැදෙන්නාවූ ධර්ම කියන එක. ඒක ගොඩක් ලඟින් යනවා. ඒක නිසා කෙනෙක් ඇහුවොත් එහෙම ''පට්ඨානය  කියන්නේ මොකක්ද'' කියල එතකොට අපි දැනගෙන තියෙන්න ඕනෑ 'පට්ඨානය කියන එකේ තේරුම. නොයෙක් ප්‍රත්‍යයන් ඇතිවෙලා හැදෙනවා  කියන එකයි' පට්ඨානය කියල කියන්නේ. එහෙමනම් **'පට්ඨානය'** කියල දැනගන්න කොට ඒ හේතු මොනවාද, ලඟ හේතු මොනවාද , දුර හේතු මොනවාද, ආන්න ඒවා ටික කියන්න ඒවගේ ඔක්කොම බැරි උනත් ඒ ටික දැනගන්න, හිතා ගන්න, විස්තර කර ගන්න ටිකක් හරි පුළුවන් කම තියෙන්න ඕන. මේ කතාව කියන කොට මේ පින්වතුන්ට මහා අමුතු දෙයක් හැඟෙන්ට පුළුවන්. දැන් එක වචනයයි මේ පින්වතුන්ට මම කියල දෙන්නේ. ඒ තමයි **'පට්ඨාන'** කියන ව වචනය.

'නොයෙක් හේතු ප්‍රත්‍යය ධර්මයන්ගෙන් ඇතිවන බව' කියන එකනේ. ඉතිං අපි ඕක කාට හරි කිව්වොත් එහෙම කොහොමද කියන්නේ නොයෙක් හේතුන්ගේ හට ගන්නාවූ දේ කියල. නොයෙක් හේතුන්ගේ හට ගන්නාවූ දේ කියල අපි කොහොමද කියන්නේ. මෙහෙම හිතන්න බලන්න. ඒ තමයි  බත් හැදෙන්නේ මොනවයින්ද? බත් හැදෙන්නේ හාල් වලින්නේ. එතකොට බත් හැදීමට හාල් හේතු වෙනවනේ. හිතල බලන්න බත් හැදෙන්ට හාල් විතරක් හේතු වෙනවාද? ඒ ඇත්ද? නා නා ප්‍රකාර හේතූන්ගෙන් යමක් හැදෙනවා කියන එක තේරුම ගන්නයි මේ කියන්නේ. බත් හැදෙන්නේ හාල් වලින් විතරද?  බත් හැදෙන්නේ හාල් වලින් විතරක් නෙමෙයි. බත් හැදෙන්ට හාල් අවශ්‍යයි. බත් හැදෙන්ට වතුර අවශ්‍යයි. බත් හැදෙන්ට හැලියක් අවශ්‍යයි. බත් හැදෙන්ට ගින්දර අවශ්‍යයි. ඒවගේම බත් හැදෙන්න හැන්දක් අවශ්‍යයි. බතක් හැදෙන්ට බත උයන කෙනෙක් අවශ්‍ය යයි. ඒ වාගේම බත් හැදෙන්ට දර

අවශ්‍ය යයි. ඒවාගේම බත හැදෙන්ට ගල් වලින් හෝ හදාගන්ත ලිපක් අවශ්‍ය යයි. ඒවගේම දැන් මේ බලන්න  බත් හැදෙන්ට අවශ්‍ය කරන්නාවූ ටික. එතනම තියෙනවනේ මහා ගොඩක්. ලිපක් අවශ්‍යයි ගින්දරක් අවශ්‍යයි දර අවශ්‍යයි වතුර අවශ්‍යයි, හැලියක් අවශ්‍යයි, ඒක වහන්න එකක් අවශ්‍යයි, උයන්න එකක් අවශ්‍යයි, උයන්න කෙනෙක් අවශ්‍යයි. මේ බත හැදෙන තැන ලඟම ලඟ  තිබෙන්නාවූ  උපකාරක ධර්ම. ඔය ධර්මවල උපකාරය නැතුව නිකං බත් හැදෙන්නේ නෑ. හැබැයි බත් හැදෙන්ට මේ සමූහයෙන් ගත්තම බලන්න හාල් අවශ්‍යයි කිව්වා, හැලියක් අවශ්‍යයි කිව්වා, ගින්දර අවශ්‍යයි කිව්වා, ලිපක් අවශ්‍යයි කිව්වා, දර අවශ්‍යයි කිව්වා, උයන කෙනෙක් අවශ්‍යයි කිව්වා, වතුර අවශ්‍යයි කිව්වා. ඔය කිව්ව ටිකෙන් අපිට 'හාල්'  ප්‍රධානම එක අනිත් ඒවා උපකාරක ධර්‍ම. දැන් මේ උපකාරක ධර්‍ම නැතුව හාල් තිබුන පමණින් බතක් හැදෙන්නේ නැහැ. ආන්න ඒක නිසා  කියනවා නොයෙක් ප්‍රත්‍යය ධර්‍මයන් නිසා යමක් හට ගන්නවා කියල. ඒ යමක් හට ගන්න දේ කියල දෙන පාඩමට, ඒ යමක් හටගන්න කොට, ඇතිවෙන කොට, නොයෙක් අර්ථයන්ගෙන් මතුවෙන බව සලකන, හිතන, මෙනෙහි කරන එකට කියනවා පට්ඨානය සම්මර්ශනය කරනවා  කියල. බුදුරාජාණන් වහන්සේට ඔය යම් කිසි දෙයක් ඇතිවෙන කොට ඒ නොයෙකුත් බාහිර තිබෙන හේතු, ලඟ  හේතු, ලඟ  ප්‍රධාන හේතු, ඒවාගේම දුර හේතු  ආදී සියල්ල සලකන්න - හිතා ගන්න පුළුවන්. ඒ තරම් විසද නුවණක් තිබෙනවා.

දැන් මේ ටික බත් හැදෙන තැන  ලඟ හේතු ටික. අපි තව ටිකක් පිටිපස්සට ගියහම මෙහෙම තියෙනවා. හාල් හැදෙන්නේ මොකෙන්ද? හාල් හැදෙන්නේ වී වලින්. කොහොමද වී වලින් හාල් හැදෙන්නේ, ඒ වී නිකම්ම හාල් වෙන්නේ නෑ. හාල් කොටන්න කෙනෙක් ඕනෑ, පොලන්න කෙනෙක් ඕනෑ. හාල් හදන්න මිනිසුන්ගේ ශ්‍රමය අවශ්‍යයි. හාල් හැදෙන්න කුල්ලක් අවශ්‍යයි. එවගේම මෝල් ගහක් අවශ්‍යයි. වංගෙඩියක් අවශ්‍යයි. දැන් බලන්න හාල් හැදෙන්න අවශ්‍ය දේවල් කොච්චර තියෙනවද එතන. වී වලින් හාල් එන්න වංගෙඩියක් මෝල් ගහක් ඒ වාගේම පොලන කෙනෙක් ඊළගට වී කොටනවා කියල කියනවා. ඊළගට  ඒවා හදන්න කුල්ලක් භාජනයක් අවශ්‍යයි හාල් දාන්න. ඔය ටික ඔක්කොම උපකාරක ධර්‍ම. ඔතනින් නවතිනවද නෑ. යමු තව පිටිපස්සට. ගියන් පස්සේ වී කොහෙන්ද එන්නේ. වී හැදෙන්නේ ගොයම් ගහේ. එතකොට වී හැදෙන්න නම් ගොයම් ගහේ කරලක් තියෙන්න ඕන, නටුවක් තියෙන්න ඕන, ගොයම් පැලයක් තියෙන්න ඕන, හැදෙන්න ඕන. ගොයම් හැදෙන්න නම් වතුර තියෙන්න ඕන, කුඹුරක් තිබෙන්න ඕන. නියරවල් තිබෙන්න ඕන, ගොවියෙක් ඉන්න ඕන හුළං තියෙන්න ඕන  අව්ව තියෙන්න ඕන ඊළගට බීජ වර්ග තියෙන්න ඕන, රකින කෙනෙක් ඉන්න ඕන.

හැම දේම එකතු වෙලා තමයි මේ වී හැදුනේ. මේ වී තමයි කීප දෙනෙකුගේ එක්කාසුව හින්ද හාල් බවට පත් උනේ. හාල් ටික තමයි තවත් උපකාරක ධර්මයන්ගේ එක්කාසුව සංකලය නිසා බත් බවට පත් උනේ. බත් පිඟානක් ගන්න කොට ළඟ වශයෙන් දුර වශයෙන් ගොඩක් හේතු ගොඩක් උපකාරක ධර්ම තියෙනවා. අන්න ඒ මෙච්චර ප්‍රමාණයක උපකාරක ධර්ම රාශියකින්, හේතු ධර්ම රාශියකින් මෙන්න මේ දේ හැදුන, මේ උපකාරක ධර්ම සියල්ලම එකින් එකට වෙනස්ව තමයි මේකට උපකාර උනේ කියනඑක පිළිබඳව දකින්ට පුළුවන් නුවණ බුදුරාජාණන් වහන්සේට තියෙනවා. අන්න ඒ නුවණින් තමයි බුදුරාජාණන් වහන්සේ මේ නොයෙක් හේතුන්ගෙන් හැදෙන බව දැනගත්තේ. අන්න ඒකට කියනවා **'පට්ඨානය'** කියල.

පාලි භාෂාවේ තිබෙනවා **'ඨාන'** කියල වචනයක්. ඔය **'ඨාන'** කියන වචනය සමහර කෙනෙක් අර්ථ කථනය කරන්න බලනවා 'ස්ථානය' කියල. ඒ අර්ථයත් සමහර තැන්වල සැලකුවට **'ඨාන'** කියන වචනය ගොඩක් කථා වෙනවා **'පටිසම්භිදාවේ'**. මේකත් අපේ පිංවතුන් දැන ගන්න. **'ඨාන'** කියන එකේ බහුලව අර්ථ ගන්නන කාරණය තමයි **'කාරණය'** කියන එක. ඒවගේම **reason** එක, **'හේතුව'**. මෙන්න මේ අර්ථය තමයි තියෙන්නේ මේ 'ඨාන' කියන වචනේ. එතකොට **'ප' - 'ඨාන'** කියන එකෙන් කියවෙන්නේ **'විශේෂ කාරණය'** එහෙම නැත්නම් **'බහු කාරණා'** යන්නයි. අද මේක සරලව තමයි හසුරුවන්නේ. **'ඨාන'** කියන වචනයේ තේරුම **'කාරණය' 'හේතුව'** එහෙම නැත්නම් **'reason'** එක. දැන් මේ **'ඨාන'** කියන වචනයට **'ප'** යන්න එකතු කරාට පස්සේ කියන්නේ **'ප''ඨාන'** කියල. ඒ කියන්නේ නොයෙක් කාරණා නිසා කියන එක. හැබැයි අපිට **'ප'- 'ඨාන'** කියල කියන්න බෑ. පාලියෙහි ව්‍යාකරණ නීතියක් තියෙනවා **'ඨාන'** කියන පදයට මුලින් **'ප'** යන්නක් යෙදූ කල ඒ **'ඨ'** අකුර දෙකක් කල යුතුයි කියල. ඒ නීතියට යටත්ව තමයි **'ප-ඨාන'** කියන එක **'පට්ඨාන'** වෙලා තියෙන්නේ. ඒකෙ තේරුම 'බහු කාරණා නිසා ඇති වෙනවා, හැදෙනවා, ක්‍රියාත්මක වෙනවා' කියන එක තමයි ඔය විදියට තේරුම් ගන්න ඕන වෙන්නේ.

දැන් මම මේ කියපු වචන පේලිය හින්ද මම විස්වාස කරනවා මේක තේරෙන්න ඇති කියල. අපි බලමු තව ටිකක් ඉදිරියට ගිහිල්ල.

මේ පට්ඨානය කියන නොයෙක් හේතු කාරණා නිසා තිබෙන දේවල් ඒවාගේම යමක් ඇති වෙන්න ඉදිරිපත්වෙන නොයෙක් හේතු කාරණා කියල දෙන්නාවූ බණ පොතක් තියෙනවා. ඒ පොතට කියනවා ප්‍රකරණයක් කියල. ප්‍රකරණය = පොත = විස්තර කථනය. ඒ පොත නොයෙක් දේවල් ගැන සිද්ධ වෙන සිද්දීන් ගැන විස්තරයක් කරන නිසාවෙන් ඒකට කියනවා **'පට්ඨාන**

**ප්‍රකරණය’** කියල. ඒකෙ තියෙන්නේ ඔය බහුල කාරණා සිදුවන හැටි. දැන් මේ පට්ඨානයේ තිබෙනවා කරුණු ටිකක් දැනගන්න. එකේ තිබෙනවා ප්‍රත්‍යය ධර්ම 24ක්. ඒ ප්‍රත්‍යය ධර්ම 24 කියන එකෙන් අපේ මේ අලුතින් රැදී සිටින පින්වතුන්ටත් මේ දහම් වැඩ සටහනේ  රැදී ගැලී සිටින පින්වතුන්ටත් ලේසියෙන්ම තේරෙන කොටසකුත් තියෙනවා ඕකේ අමාරු එකකුත් තියෙනවා. ලේසිම එක තමයි ප්‍රත්‍යය 24 කියන එක. සුවිසි ප්‍රත්‍යය කියන එක. එකේ සුවිසි කියන එක ලේසියි. ඒක හිතාගන්න ලේසියි. ඒක ගානක්නේ. අමාරු එක තමයි ‘පච්චය’ කියන එක. ‘පච්චය’ කියන  එකෙන් කියන්නේ ‘උපකාරක’ ධර්මය කියන එක. යමක් ඇතිවෙන්න උපකාර වෙන්නාවූ දේට කියනවා ‘උපකාරක ධර්මය’ කියල. ඒවගේ  උපකාරක ධර්ම දේශනා කල දේශනාවේ තිබෙනවා 24ක්. ඒ 24 ගැන කියනවා, ‘හේතු’ වශයෙන් උපකාර වන  ධර්මය ‘හේතු ප්‍රත්‍යය’ – ‘ආරම්මණ’ වශයෙන් උපකාර වන ධර්මය ‘ආරම්මණ ප්‍රත්‍යය’ – ‘අධිපති’ වශයෙන් උපකාර වන ධර්මය ‘අධිපති ප්‍රත්‍යය’ - ඊළගට ‘අනන්තර’ වශයෙන් උපකාරක වන ධර්මය ‘අනන්තර ප්‍රත්‍යය’ ඔයවගේ ‘සමනන්තර’, ‘සහජාත’, ‘අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය’, ‘නිශ්‍රය’, ‘උපනිශ්‍රය’, ‘පුරේජාත’, ‘පච්ඡා ජාත’, ‘ආසේවන’, ‘කම්ම’, ‘විපාක’, ‘ආහාර’, ‘ඉන්ද්‍රිය’, ‘ඣාන’, ‘මග්ග’, ‘සම්ප්‍රයුක්ත’, ‘විප්පයුක්ත’, ‘අත්ථි’, ‘නත්ථි’, ‘විගත’, ‘අවිගත’ වශයෙන් 24ක් තියෙනවා. ඒ 24 ම උපකාරක ධර්ම යමක් ඇතිවීමට. අපි ඒ ගැනත් කථා කරමු ඉස්සරහදි.

දැන් කෙනෙකුට මෙහෙම හිතෙන්න පුළුවන්. බුදුරජාණන් වහන්සේ මේ ප්‍රත්‍යය ධර්ම 24 ක් විතරද මේකෙන් තෝර ගත්තේ හඳුනාගත්තේ මෙච්චර අනන්ත නය සමන්නාගත සමන්ත පට්ඨානයකින් කියල. ඇත්ත වශයෙන්ම බුදුරාජාණන් වහන්සේ මේ දේශනා කරන්නේ මනුෂ්‍යකුගේ,  සාමාන්‍ය කෙනෙකුගේ හිතට දැන ගන්න පුළුවන් කොටසක් විතරයි මේකේ කියල තියෙන්නේ. ඔය පට්ඨානයේ අනන්ත සාගරයම දේශනා කරල නැහැ. අභිධර්මයේත් බොහොම ටිකයි දේශනා කරලා තියෙන්නෙත්. ඒකත් මාතෘකා වශයෙන් බුදුරාජාණන් වහන්සේ දෙසුව, සැරියුත් ස්වාමීන්වහන්සේ විස්තර කථනය කලා. ඒක ඒ සවාමීන් වහන්සේටම බාර දුන්නේ ඒ ස්වාමීන්හන්සේ ඒ වැඩේ කරයි කියල. හොඳ පාරමී ධර්ම ශක්තියක් හොඳ ප්‍රඥාවක් උන්වහන්සේට තියෙන නිසා බුදුරජාණන්වහන්සේ උන්වහන්සේට පැවරුවා. තවත් කාරණයක් මේ වෙලාවේදී මතක් කර ගන්න සිහිපත් කරගන්න. දවසක් බුදුරාජාණන් වහන්සේ ඇට්ටේරියා වනයක වැඩ ඉන්නවා. උන්වහන්සේ උපමා කීපයකින් උන්වහන්සේගේ අවබෝධිත ධර්මය සහ දෙසූ ධර්මය පිළිබඳව මෙහෙම කියනවා. උන්වහන්සේ ඇට්ටේරියා කොළ ටිකක් අතට අරගෙන පෙන්නනවා “මහණෙනි මේ මගේ අතේ තිබෙන්නාවූ

ඇට්ටේරියා කොළද වැඩි නැත්නම් මේ වනයේ ගස්වල වැවිලා තිබෙන ඒවාද වැඩි'' කියල. උත්තරේ හරි සරලයි නේ. මේ භික්ෂූන් වහන්සේලා කියනවා ''ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේගේ අතේ තිබෙන්නාවූ ඒ ඇට්ටේරියා කොළ හරි ටිකයි, මේ වනාන්තරේ තිබෙන්නාවූ ගස්වල සහ පොළවේ වැටී තිබෙන කොළ මහා විශාල ගොඩක්. බුදුරාජාණන් වහන්සේ දේශනා කරනවා ''අන්න ඒ වගේ තමයි මම අවබෝධ කරගත් ධර්මය සහ දෙසූ ධර්මය'' කියල. උන්වහන්සේ තවත් වේලාවක නියට පස් ටිකක් ගන්නවා. අරගෙනත් අහනවා ඇඟිල්ලේ තිබෙන්නාවූ පස් ටිකද වැඩි පොළවේ තිබෙන පස්ද කියල, පොළවේ තිබෙන පස් වැඩියි කියල කියනවා භික්ෂූන්වහන්සේලා. ඔය උපමා දෙකෙන්ම උන්වහන්සේ සඳහන් කරන්නේ තමන් වහන්සේ අවබෝධ කරගත්තාවූ ධර්මය හරියට ඇට්ටේරියා වනයේ තිබෙන්නාවූ කොළ වගේ සහ ඒවගේම පොළවේ තිබෙන්නාවූ පස් වගේ මහා විශාල ප්‍රමාණයක් අවබෝධ කරගත්තා නමුත් දේශනා කරපු ධර්මය අතේ තිබෙන්නාවූ ඇට්ටේරියා කොළ ටික වගේම අර ඇඟිල්ලට ගත්තාවූ පස්ටික වගේ පොඩ්ඩක්. ඉතිං මේ අනන්ත නය සාගරයේ අනන්ත 'නය' සාගරයක් තිබෙන මේ ධර්ම කොට්ටාශය දේශනා කිරීමේදීත් මේ සාමාන්‍ය මනුෂ්‍ය හිතට ගැලපෙන ධර්ම පරාසයක් පමණක් බුදුරාජාණන් වහන්සේගේ දේශනාවේ විස්තර කරලා තිබෙනවා. 'අනන්ත නය සමන්නාගත සමන්ත පට්ඨානය' - ඒ තරම් විශාල ධර්මන්‍යාය රාශියකට ගිලිල යන්න තරම් නුවණක් සාමාන්‍ය කෙනෙකුට නෑ. ලොව්තුරා බුදුරාජාණන් වහන්සේට තියෙනවා. උන්වහන්සේ ඒ ධර්මය උන්වහන්සේගේ සර්වඥතාඥානයෙන් මෙනෙහි කරනවා, සම්මර්ශනය කරනවා.

තවත් කථාවක් මට කියන්න ඕන. ඒ තමයි, දැන් පට්ඨානය කියන වචනය මම කියල දුන්න. හේතුව, ඒක මේ පිංවතුන් දැනගන්නට ඕන. දැනගෙන තිබුනොත් විතරයි මට ප්‍රයෝජනවත් වෙන්නේ අනිත් ටික කියන්න. ප්‍රත්‍යය කියන වචනය කිව්වා ප්‍රත්‍යය කියල කියන්නේ උපකාරක ධර්මය කියන එකයි.

මේ තව එකක් තියෙනවා පින්වතුනි මෙන්න මෙහෙම, මගෙන් අහනවා සමහර අය ටෙලිෆෝන් කරලත් අහනවා හම්බ උනහමත් අහනවා ස්වාමීන්වහන්ස බුදුරජාණන්වහන්සේගේ ධර්මය අවබෝධ කරගන්න තේරුම් කරගන්න අභිධර්මය දැන ගන්නම ඕනද කියල. එහෙම අහනවා ප්‍රශ්න. ඉතිං මේ විස්තර, අභිධර්මය එහෙම දැනගන්න අනිවාර්යද? ඉතිං මම ඒකට දෙන උත්තරේ තමයි, දැන් ඕක අනිවාර්යයි කියල කිව්ව ගමන් තව සූත්‍ර එහෙම අහල නිවන් දැකපු අයත් ඉන්නවනේ, ඒ අයට මොකද කියන්නේ. මේක අනිවාර්යම නෑ, හැබැයි අභිධර්මය දැන ගන්නේ නැතුව කවුරුවත් නිවන් දකින්නෙත් නෑ. ඔය දකින හැම දෙයක්ම අභිධර්මයක් තමයි. දැන් අභිධර්මය

කියන්නාවූ කොටසින් විස්තර වෙන්නේ - සිත පිළිබඳව කියවෙනවා - චෛතසික ධර්ම පිළිබඳව කියවෙනවා - රූප ධර්ම පිළිබඳව කියවෙනවා - නිර්වාන ධාතුව පිළිබඳව කියවෙනවා. ඔය තමයි ඔය අභිධර්මයට අයිති කොටස. ඒගැන විස්තරයක් කරන එක තමයි මේ පට්ඨානය. දැන් කෙනෙක් ඇහුවොත් එහෙම අභිධර්මය ඉගෙන ගැනීම නිවන් අවබෝධ කරගන්න ඕනැමද කියල, දැන් මේ අභිධර්මය කියන්නේ මොකක්ද? සිත, චෛතසික ධර්ම, රූප ධර්‍ම සහ නිර්වානය. ඉතිං ඔය ටික දන්නේ නැතුව නිවන් දකින්න බැනේ.

ඉතිං එක විදියකට කියනවා අභිධර්මය කියල උගන්වන කොටස සමහර අය අඩුවෙන් දැනගන්නවා සමහර අය වැඩියෙන් දැනගන්නවා. හැබැයි කිසිම කෙනෙක් ඔය හිත හඳුනා ගන්නේ නැතුව - සිතේ තියෙන ධර්‍ම ස්වභාවය හඳුනා ගන්නේ නැතුව - තේරුම් ගන්නේ නැතුව - චෛතසික ධර්‍මයන්ගේ ස්වභාවය තේරුම් ගන්නේ නැතුව - වේදනාවේ හැටි හඳුනා ගන්නේ නැතුව - රූප ධර්‍ම කායික වශයෙන් හඳුනා ගන්නේ නැතුව - එවාගේම නිර්වාණ ධාතුව හඳුන ගන්නේ නැතුව නිවන් දකින්නේ නෑ. ඒක එකක්.

එතකොට එක විදියකට තියෙනවා - මේක detail වශයෙන් දැනගන්න අවශ්‍ය නෑ. හැබැයි එක එක්කෙනාගේ මට්ටමට අනුව කොටස් දැනගන්න ඕන. හැබැයි ඒ ධර්‍මය දන්නේ නැතුව නම් කවුරුවත් නිවන් දකින්නේ නෑ. ඒක නිසා හොඳට ඒ ධර්‍ම වල තිබෙන ලක්ෂණ හඳුනා ගන්ට ඕන.

ඊළගට තව එකක් තිබෙනවා. සමහර අයට හිතේ මතක නැති වෙන ගතිය තියෙනවා. ඒක නිසා බයයි. මට මේවා මතක නැතිවෙයි කියල. හැබැයි මතක තියා ගන්න පුළුවන් කම තියෙන්නේ අවංකවම එතනට හිතින් සපර්ශ වෙලා ඒ ධර්‍ම කාණ්ඩය දැන් හඳුනා ගත්තොත් පමණයි. එතකොට අමුතුවෙන් මතක තියා ගන්න ඕනෑ කියල උත්සාහයක් අවශ්‍ය වෙන්නෙත් නෑ. ඒ ටිකත් මේ පින්වතුන් දැන ගන්න.

අනිත් එක තමයි මෙන්න මේ කාරණය විශේෂයි. සමහර කෙනෙකුට චෛත්‍යයක් ළඟට ගිහිල්ල - බෝධීන් වහන්සේ නමක් ගාවට ගිහිල්ල - ගොඩක් මල් කඩල වට්ටේට තියල - ඒ බෝධීන් වහන්සේ දිහා චෛත්‍යය දිහා බලාගෙන හිටියහම හරි සතුටක් දැනෙනවා. ඒ අය ඒකෙන් ආගමික සන්තෝසයක් අධ්‍යාත්මික වශයෙන් සන්තෝසයක්, කුසල සන්තෝසයක් පුණ්‍ය සන්තෝසයක් විඳිනවා. සමහර කෙනෙකුට කොච්චර මල් තිබ්බත් එහෙම වෙන්නේ නෑ. ඒ කියන්නේ සන්තෝසයක් නැතුව නෙමෙයි, ඒ තරම් මහා ගාම්භීර සන්තෝසයක් ඇතිවෙන්නේ නෑ. ඒ අයට තියෙන්න ඕන කාටහරි උදව්වක් උපකාරයක් කරලා, අර මල් කඩල තැන්පත් කරල ඒක දිහා

බලාගෙන ඉදල සතුටු වෙනවට වඩා කෙනෙකුට උදව්වක් උපකාරයක් කරලා වතුර කෝප්පයක් දීල සතුටු වන ගතිය සමහරුන්ට තිබෙනවා. හැබැයි ඒ ගතිය තවත් කෙනෙකුට නෑ. ඇයි අපි කාටවත් උදව් කරන්නේ කියල හිතන්න පුළුවන්.

ඒ වාගේම ධර්ම කාණ්ඩ පිළිබඳව හිතුවමත් සමහර අයට තිබෙනවා ඔය කොහේ හරි ගිහිල්ල කථා කරන්නේ නැතුව බිම බලාගෙන හිටියට පස්සේ ඒ ගොල්ලන්ට හිතෙනවා හරි සන්තෝසයක්. හැබැයි ඒක තව කොටසකට නෑ. ඒ අයට ගොඩක් කථා කරන්න ඕන. කථා කරායින් පස්සේ තමයි ඒ ගොල්ලන්ට සතුට ඇතිවෙන්නේ. සමහර අය ඉන්නවා සූත්‍රයක් කියෙව්වයින් පස්සේ ඒ සූත්‍රයේ තියෙන ධර්ම කොටස් මෙනෙහි කරන කොට හරිම සන්තෝසයක් දැනෙනවා. ඒ ගොල්ල සතුටු වෙනවා ඒකෙන්.

එතකොට අපි කථා කරේ ශ්‍රද්ධාව අපිට පහළ වෙන විදිය. දැන් ඔය අපේ චිත්තප්‍රසාධය වාගේම ශ්‍රද්ධාව පහළ වෙන්ට සමහර කෙනෙකුට සාමාන්‍ය ආමිස පින්කමක් වන්දනාවක් වගේ දෙයක් ප්‍රමාණවත් වෙනවා. හැබැයි හැම කෙනාටම ඒක ගැලපෙන්නේ නෑ. සමහර කෙනෙකුට බොහෝම චිත්ත ප්‍රසාධය හැදෙන්නේ - ඇතිවෙන්නේ ගාම්භීර ධර්ම - සූත්‍ර දේශනා - ගාම්භීර ධර්ම මනසිකාරය කරන කොට, කථාකරන කොට, සම්මර්ශනය කරන කොට, ඒක ඒ හිත් වල හැටි. ඒකනිසා හැම එක්කෙනාටම පට්ඨානය ගැන කථා කරන කොට ඔය විදියට අපි පට්ඨානය කියන වචනය දැන ගන්න ඕන. ඒ වාගේම ප්‍රත්‍යය ධර්ම පිළිබඳවත් අපි දැනුවත් වෙලා ඉන්න ඕන. ඒක අපේ පින්වතුන්ට හරි පහසුවක් වෙනවා.

ඊළගට අපිට ධර්ම සන්තෝසයක් ලබන්න පුළුවන් ධර්ම පරාසයක් වෙන්න ඕන. හැම එක්කෙනාටම ඒක ගැලපෙන්නෙත් නෑ, අනිත් එක නොගැලපෙන්නෙත් නෑ. මේ වෙලාවේදී අපි ඒක නිසා ඒ කරුණු ටිකත් මතක් කරනවා. දැන් මේ කොටස් ටික කියාගෙන යනකොට අපි තේරුම් ගන්ට ඕනෑ අපි හැම එක්කෙනාටම ගාම්භීර ධර්මය පිළිබඳව මෙනෙහි කරලා දහම් සතුටක් ලබා ගන්නවා වගේම මේවගේ තිබෙන්නාවූ නියම ස්වරූපය තේරුම් ගැනීමටත් මේක උපකාර වෙනවා. ඒකනිසා අපි මේ ප්‍රත්‍යය කියන වචනය තව ටිකක් හිතල බැලුවොත් එහෙම ඒකෙන් කියවෙන්නේ

- නූපන්නාවූ චිත්ත චෛතසිකයන් හටගන්ට, ඇතිවෙන්න, මතුවෙන්න උපකාර වන්නාවූ ධර්මයකට කියනවා ‘ප්‍රත්‍යය’ කියල. එහෙම නැතිනම් ‘පච්චය’ කියල කියනවා පාලියෙන්.

- තව එකක් තියෙනවා - ඒ වගේ ඉපදුනා වූ - සිත් ඉපදුනාවූ - චෛතසික ඉපදුනාවූ - රූපයෝ පැවතීමට හේතු වන්නාවූ උපකාර වෙන්නාවූ ධර්ම කොටසට කියනවා 'ප්‍රත්‍යය' කියල.
- උපන්නාවූ චිත්ත චෛතසිකයෝ - උපන්නාවූ රූප ධර්මයෝ පෙළට පරම්පරා වශයෙන් දිගට වැඩි වැඩී පවතින්න උපකාර වෙන ඒවාට කියනවා 'ප්‍රත්‍යය' ධර්ම කියල.

එතකොට 'ප්‍රත්‍යය' කියල කියන්නේ - නූපන්නාවූ සිත් හටගන්නත් නූපන්නාවූ චෛතසික හට ගන්නත් නූපන්නාවූ රූප හටගන්නත් උදව් වෙනව උපකාර වෙනව කියන එක. උපන්නාවූ සිත් වලට උපන්නාවූ චෛතසික වලට උපන්නාවූ රූප වලට ඉදිරියට පැවතීමට හේතු වන්නාවූ උපකාර වන්නාවූ දෙයට කියනවා 'ප්‍රත්‍යය' කියල.

දැන් මේ ප්‍රත්‍යය කියන වචනයත් අපි තේරුම් ගන්ට ඕනෑ. දැන් අපි පට්ඨානය කියන වචනය තේරුම් ගත්ත. ප්‍රත්‍යය කියන වචනයත් මේ වෙලාවට ගැලපෙන කොටසක් අපි කියල දුන්න. ප්‍රත්‍යය කියන වචනයේ තේරුම් උපකාරක ධර්මය.

ඊළගට තියෙනවා අපිට දැනගන්න මේ ගැන විශේෂයෙන්ම - දැන් මේ පරමාර්ථ ධර්ම පිළිබඳ අත පත ගැහීමක් මේ කරන්නේ. පරමාර්ථ ධර්ම සමග තමයි මේ පට්ඨාන ගනුවෙනුව සිද්ධ වෙන්නේ. ඊට වඩා මෙහා පැත්තේ ලෝකීය වශයෙන් කථා කරන සම්මුතියේ තිබෙන්නාවූ කොටස් නෙවෙයි. අපි හැම එක්කෙනාටම මේ පට්ඨාන ධර්මය නියම නිවැරදි ධර්ම කොට්ටාශයක් හැටියට දැන ගැනීම සඳහා ඉගෙන ගන්න ඕනෑ නම් අපි හැම එක්කෙනාම දැන ගන්න ඕනෑ පරමාර්ථ ධර්ම කියන්නේ මොනවද කියල. පරමාර්ථ ධර්මයන්ගේ තිබෙන්නාවූ නියම ලක්ෂණ ස්වරූපයෝ අපි දැන ගන්න ඕන. ඒක මේ පිංචතුන් ලියාගෙන තියා ගත්තත් කමක් නැහැ. පරමාර්ථ ධර්ම මොනවාද, පරමාර්ථ ධර්මයන්ගේ ලක්ෂණ ඒවගේ ස්වරූපයෝ, ඒවායේ බෙදීම් මොනවද කියල දැන ගන්න ඕන.

ඊළගට තියනවා ප්‍රත්‍යය ධර්ම 24ක්. ඒ ප්‍රත්‍යය ධර්ම 24 හේතු, අරම්මණ, අධිපති ආදී වශයෙන් තිබෙන්නාවූ ප්‍රත්‍යය ධර්ම 24 තිබෙන ස්වභාවය. ඒ කියන්නේ ඔය 24ක් වෙන්න හේතුව එකට එකක් සම නෑ කියන එකනේ. එතකොට 24ක් වෙන්න හේතුව එකින් එකකම ලක්ෂණ වෙනස් කියන එකනේ. ඒවගේ ගුණයෝ, ඒවගේ හැඩ, ඒවගේ ලක්ෂණ වෙනස්. ඒක නිසා ස්වරූප වශයෙන්, ලක්ෂණ වශයෙන් බෙදිලා තිබෙන්නාවූ වෙනස් අංග තිබෙන මේ ප්‍රත්‍යය ධර්ම24 අපි දැන ගන්න ඕන. දැන් මම කිව්වා සිත්වල

එහෙම නැතනම් චිත්ත චෛතසික, රූප, නිර්වාණ කියන මේ පරමාර්ථ ධර්මයන්ගේ ලක්ෂණ ස්වරූප අපි දැනගෙන තියෙන්න ඕන. ඊළගට හේතු, ආරම්මණ වශයෙන් තිබෙන්නාවූ ඒ සූවිසි ප්‍රත්‍යයන්ගේ තිබෙන ස්වරූපයන් ලක්ෂණයන් දැන හඳුනා ගන්ට ඕන.

තව තියෙනවා එකක්, ඒකට කියනවා ප්‍රත්‍යයයන් රාශිගත කරනවා - කොටස් කරනවා කියල. කොටස් කිරීමත් අපි දැනගෙන තියෙන්න ඕන. ඊළගට ඒවගේ එක්කාසුව ක්‍රියාත්මක වෙන විදිය අපි පස්සේ වෙලාවක කියල දෙනවා.

අද බාධාවලුත් තිබුන තරමක්. මම මෙතනදී කියල දුන්නේ හරි පොඩි ටිකයි. මේ ධර්ම කොට්ඨාසයෙන් කියල දුන්නේ හරි පොඩි ටිකයි. වචන දෙක තුනක් කියල දුන්නේ. ඒ වචන දෙක තුන කියන්ට හේතුව ඒවා දැන ගන්නේ නැතුව මේ වැඩේට අත ගහන්න අමාරු නිසා. ඒ කියන්නේ මේකට tool set එක තියෙන්න එපාය. ඒ tool set එක හදාගන්නේ නැතුව මේවා කථා කරන්නත් අමාරුයි, යන්නත් අමාරුයි හිතන්නත් අමාරුයි. ඒ නිසා මේ කොටස් ටික කියල දුන්නේ. තවත් මට කොටසක් කියල දෙන්න තියෙනවා ඒ කොටස් ටික කියල දෙන්න කලින් මම ධර්ම කොටස් 5ක් නම් කරනවා. අපේ මේ පින්වතුන් ඒවා සටහන් කරගන්නවානම් හොඳයි කියලත් මම කියනවා.

අපි මේකෙන් කථා කරන්න යන්නේ, ධර්ම කරුණු 5ක් තියෙනවා - ප්‍රධාන 4යි තව එකක් තියෙනවා, අපි කථා කරන කොට ඒක ඇඳල ගන්නවා. ඒ තමයි සිත ගැන කථා කරනවා, චෛතසික ගැන කථා කරනවා රූප ධර්මයෝ පිළිබඳ කථා කරනවා, නිර්වාණ ධාතුව පිළිබඳ කථා කරනවා. ඒ සිතටත් චෛතසික වලටත් රූප වලටත් නිර්වාණයටත් කියන්නාවූ ඒ ධර්ම විස්තර කිරිමේදී භාවිතා කරන්නාවූ වචන, එනම් ප්‍රඥප්ති - පැනවීම් - පිළිබඳවත් අපි කථා කරනවා. දැන් මෙන්න මේ ධර්ම කොටස් - චිත්ත චෛතසික රූප නිර්වාණ ප්‍රඥප්ති කියන මේ ධර්ම 5 පිළිබඳව අපි ඉස්සරහදි සාකච්ඡා කරනවා.

තවත් තියෙනවා බෙදීමක් කරන්න නමුත් මේ වෙලාවේදී අපි පොඩි පරීක්ෂණයක් වගේ දෙයක් සිද්ද කරනවා. පොඩි වෙලාවක් අරගෙන මේ පින්වතුන්ට මං කියල දීපු ටික තේරුනාද වැටහුනාද කියන එක පොඩ්ඩක් පරික්ෂා කරන්න. මම පළමුවෙන්ම ප්‍රාර්ථනා කරපු දෙය තමයි අපි මේ මහන්සිවෙලා skype මාධ්‍ය හරහා ඇවිල්ල මේ ගොඩක් කථා කරලා කරලා කියල දෙන දේවල් මේ පින්වතුන්ගේ හිත වලට නියම විදියට යන්නේ නැත්නම් ඒක අපේ උත්සාහය ටිකක් අසාර්ථක වෙනවා වගේ. ඒක නිසා අපි හරිම සන්තෝසයි මේ පින්වතුන්ට මේ කියල දීපු ටික මොනවිදියට ද තේරුනේ කියල දැන ගන්න ලැබෙනවානම්. අපි ඒකට මේ වෙලාවේදී

අවස්ථාවක් ලබා දෙනවා පිංවතුන් කථා කරලා කියන එක හොඳයි. සැම දෙනාටම තෙරුවන් සරණයි!

හොඳයි මම බොහොම මෛත්‍රීයෙන් සිහිපත් කරනවා අපේ වසන්ත මහත්තයාගේ ඒ ග්‍රහණය කර ගත්ත විදිය හරිම හොඳයි. වසන්ත මහත්තය ඒ පෙලගස්සපු විදිය අපි කියාගෙන ගිය විදියමයි. ඒ විදියට සටහන් ගහ ගත්තනම් බොහොම හොඳයි. මම හරියට අගේ කරනවා ඒ විදියට තමයි වෙන්න ඕන. ප්‍රීති මහත්තයත් කියපු එකත් හරි හොඳයි. අන්න ඒ විදියට දැන ගැනීම හරි හොඳයි. මම තව එකක් මතක් කරන්න කැමතියි. පට්ඨානය කියන එක නොයෙක් කාරණා නිසා, බහු කාරණා නිසා, බහු උපකාරක ධර්‍ම නිසා යමක් සිද්ධ වෙන්නේ කොහොමද කියන එක තවත් උපමාවකින් මේ පිංවතුන්ගේ ලඟින්ම එනවානම් හොඳයි. මට හිතෙන හිතෙන ජාති තමයි මම කියන්නේ. නමුත් මේ පිංවතුන් ලඟිනුත් එකක් එනවනම් ඒක හරි වටිනවා ඒක දැනගන්න. අනිත් එක අපේ කල්‍යාණ මිත්‍රයෙක් ඉන්නවා කොග්ගලගේ මහත්තය ඇවිල්ල ඉන්නවා එතුමත් මම හිතන්නේ අදහසක් දැරුවොත් හරිම හොඳයි.

අනිත් එක 'නය ක්‍රමය' කියන එක. මහත්තය අපිට මේ භාෂා ප්‍රශ්නයකුත් තිබෙනවා. ඒකියන්නේ අපි වචන පාවිච්චි කරලා තියෙන්නේ සිංහල භාෂාවේ හුරුවටනේ. ඒක නිසා මේ නය ක්‍රමය කියල කිව්වට පස්සේ අපිට නම් ජේන්නේ බැංකු ණයක් වගේ. එහෙම නැත්නම් ණය ගත්තු එකක් නැත්නම් දෙන්න තියන දෙයක් එහෙම නැත්නම් 'සණසෙන්' දෙන ණයක් වගේ තමයි අපිට හිතට දැනෙන්නේ. හැබැයි මේක එහෙම නෙමෙයි. මෙහිදී 'නය ක්‍රමය' කියන්නේ 'න්‍යාය' කියන එක. ඒ කියන්නේ method එකක්. අපි කියමු මෙහෙම, මිනිස්සු ගෙවල් හදනවා. කාමර දෙකයි සාලයයි කුස්සියයි ගන්නවා. ඉතින් කාමර දෙකයි සාලයයි කුස්සියයි කියල කියන්නේ කොටස් හතරක්නේ. කාමර දෙකයි සාලයයි කුස්සියයි හදන ක්‍රමයක් තියෙනවා. ඒ ක්‍රමය කියල දෙනවා. අපි හිතමු ඒකට යන්නේ square meters 40 කියල. square meters 40 කින් හදන තාලේ කියල දෙනවා. ඒක ක්‍රමයක්, මෙන්න මේ විදියට හදන්න square meters 40 ඇතුලත මේ වගේ කාමර දෙකයි කුස්සියයි හදන්න. ඊළගට අපි හිතමු square meters 50 ක් දීල කියනවා කාමර පහේ එකක් හදන්න කියල. ඔය විදියට එක කැල්ලක කාමර 4ක් තව කැල්ලක කාමර 5ක් තව කැල්ලක 6 ක් ඔය විදියට එක එක විදියට මේ හේතු ප්‍රත්‍යය ධර්‍ම දෙකක් ඇවිල්ල හැදෙන ක්‍රමය, හේතු ප්‍රත්‍යය තුනක් එක්කාසු වෙලා හැදෙන විදිය, හේතු ප්‍රත්‍යය 4 ක් එකතු වෙලා හැදෙන තාලේ, හේතු

ප්‍රත්‍යය 7 - 8 ක් එක්කාසු වෙලා හැදෙන දේවල්. ඔය විදියට තියෙනවා න්‍යාය. ඒ කියන්නේ හැදෙන ක්‍රම. මහා අනන්තයක් තිබෙනවා. ඒ න්‍යායවල් අපේ ඔළු වලට ඒ ඔක්කොම හසුරුවන්න බැහැ. ඒක නිසා මේක දැන ගැනීමට නිවනට යන්ට උපකාරවන විදියට මේ ධර්‍ම ශක්ති පැහැදිලිව සිතෙන් සපර්ශ කරලා නුවණින් ස්පර්ශ කරලා දැන ගන්න විදියට උපකාරකව තිබෙන්නාවූ න්‍යාය ක්‍රමයක් ඔය පට්ඨානේ තියෙනවා. ඒ ටික තමයි ඔය 'නය ක්‍රමය' කියල කියන්නේ. ඒ කියන්නේ න්‍යාය ධර්මය - න්‍යාය විදිය. ඒක තමයි එකේ තේරුම. මම හිතනවා මේක තේරෙයි කියල.

තව එකක් අපේ මහත්තයෙක් කිව්වා ප්‍රඥප්තිය තේරෙන්නේ නැහැ කියල. ප්‍රඥප්තිය කියන එක මහත්තය දැන් බලන්න මෙහෙම, දැන් කන්දක් තියෙනවා. ඒ කන්ද දන්නේ නැහැ ඒකට කන්ද කියනවා කියල. හුඹහක් තියෙනවා. ඒ හුඹහ දන්නේ නැහැ එකට හුඹහ කියනවා කියල. යම් කිසි පස් ගොඩක් එකතු වෙලා උඩට ගිය, උඩින් පොඩි වෙච්ච, වටේට පැතිරිච්ච යම් කිසි භූමි ප්‍රමාණයකට කියනවා කන්ද කියල. ඉතිං ඒ කන්ද කියන වචනය අරක හඳුන්වන්ට දාපු ලේබලයක් පැනවීමක් ප්‍රඥප්තියක්. ආන්න ඒ වචනයට තමයි කියන්නේ පැනවීම හෙවත් ප්‍රඥප්තිය කියල. පොඩියට තියනවා පස් ටිකක් එකතුවෙලා. ආන්න ඒකට කියනවා තුඹස කියල. ආන්න ඒ වචනය ප්‍රඥප්තියයි. දැන් මේ ලෝකයේ යම් යම් දේවල් වලට ගස් කියල කියනව. ඒ ගස කියල කියන එක පැනවීමක් ප්‍රඥප්තියක්. දැන් ඔය හිත කියල කියන එක දැනීම් ශක්තියක්. අරමුණක් දැන ගන්නා ගුණ විශේෂය, ශක්ති විශේෂය, ධර්‍ම විශේෂයට තමයි හිත කියල කියන්නේ. ඉතිං ඒ ශක්තියට හිත කියල යම් කිසි නමක් පනවල තියෙනවනේ. ආන්න ඒ පනවපු කොටසට කියනවා ප්‍රඥප්තිය කියල. ඒ හඳුන්වන්ට දාන නම් වලට කියනවා ප්‍රඥප්තිය කියල. ඔය විදියට ඕක එකක්.

අපි තව ඉස්සරහට ගිහිල්ල දැන ගනිමු පට්ඨානය 'පොතක්' තුලින්. පට්ඨානය කියල කියන්නේ බහු හේතු එකතු වෙලා සකස් වන දේ. ඒවගේම යම් කිසි දෙයක් ඇති වෙන්ට බහු හේතූන් ඇති උනානම්, ඉදිරිපත් වෙලා තිබෙනවා නම් ලඟ වශයෙන් දුර වශයෙන් ඒවා දැන ගන්න ක්‍රම. එතකොට, පොතක් තියෙනව. පොතක් තියෙනවා කියල කිව්වම හොඳට බලන්න පොතකට පිටු 300ක් තියෙනවා. A 4 කොළ ටිකක් එකට මිටිය බැඳලා එකට clip කරලා පිට පැත්තේ කවර වලට ඝන කොළ දෙකකුත් දාලා මැද මොකක්වත් අකුරක්වත් නැහැ. ඔක්කොම හිස් blank කොළ. එහෙම ලස්සනට හදනවා පොත වගේ. තවත් යම්කිසි කාරණා ටිකක් එක්කාසු කරලා අකුරු වලින් print කරල කොළ 300 ක විතරම මොනවා හරි ලියල තියෙනව. ඒකත් පොතක්. දැන් බලන්න මේ දෙක. දෙකම එක විදියයි. දෙකේම තියෙන්නේ කොළ.

දෙකේම කොළ 300, 300 තියෙනව. එකක තියෙනවා අකුරු අනිත් එකේ අකුරු නෑ. එතකොට අකුරු නැති එක පොත වෙනවාද කියන ප්‍රශ්නය තියෙනවා. ඇත්ත වශයෙන්ම ඒක පොතක් කියල කියන්නේ නෑ. පොතක් කියන්න නම් මොකක් හරි දෙයක් සඳහන් කරපු, අර්ථ ගන්නපු, කථා කරපු විස්තරයක් එකේ තියෙන්න ඕන. දැන් බලන්න මෙහෙම, පොත මම උදාහරණයකට ගන්නවා. පොතක් හැදෙන්නේ මොකෙන්ද? අපි කියනවා පොතක් හැදෙන්න කොළ ඕන කියල. දැන් කොළ වලින් හදපු පොතක් ඔතන තියෙනවා. දැන් පොතක් හැදෙන්නට නම් කොළ ඕන, පොතක් හැදෙන්නට නම් clip එක ගහන කටු ඕන, පොතක් හැදෙන්නට නම් ඒකෙ අකුරු type කරලා තියෙන්න ඕන. පොතක් හැදෙන්නට නම් ඒකෙ නොම්බර දාල තියෙන්න ඕන. පොතක් හැදෙන්නට නම් ඒකට නමක් තියල තියෙන්න ඕන. පොතක් හැදෙන්නට නම් ඔය ටික තියෙන්න ඕන. දැන් පොතක් හැදෙන්න නම් priniting house එකක් තියෙන්න ඕන. අකුරු තියෙන්න ඕන. තීන්ත තියෙන්න ඕන. ඊළගට ඒවාට කොළ තියෙන්න ඕන. කවර තියෙන්න ඕන. මේවා ලඟ ලඟ හේතු. ඔය ටිකෙන් බෑනේ. තවත් එහාට ගියන් පස්සේ printing අයිති කාරයෙක් ඉන්න ඕන. තීන්ත හොයන්න ඕන. තීන්ත හදාගන්න ඕන. machine හදන්න ඕන. ඒවා ගලපන්න ඕනෑ. අකුරු අමුණන ඒවා තියෙන්න ඕන. typist ල ඉන්න ඕන, ඊළගට ඒවා type කරන්න අදහස් තියෙන්න ඕන, මනුෂ්‍යයෙකුගේ අදහස්නේ ඔකේ වැටෙන්නේ. ඊළගට පත්තර ගන්න කොට කොළනේ තියෙන්නේ. ඒ කොල හදපු company යක් තියෙන්න ඕනේ, ඒ company යේ වැඩ කාරයෝ ඉන්න ඕන, ඊළගට කොළ හදන්න පිදුරුවගේ දේවල් තියෙන්න ඕන පොතක් හැදෙන්නට - කොළ හැදෙන්ට, type වෙන්ට ඕන. බලන්ට කොච්චර හේතු සම්භාරයක් උපකාරක ධර්ම සමුහයක් ඔකේ පටලැවිලා ලඟ වශයෙන් දුර වශයෙන් තියෙනවද කියල. ඔන්න ඔක නිසා තමයි කියන්නේ **'ප-ඨාන'** කියල. බහු කාරණා - බහු උපකාරක ධර්ම ඒ වාගේම බොහෝම විසාල හේතු ප්‍රත්‍යය ධර්ම සමුහයක් වටකරගෙන තමයි පොත තියෙන්නේ. ඒක හැදෙන කොට ඒ ටික ලඟ වශයෙන් දුර වශයෙන් බලන බැලීමත් සහ තව එකක් තියෙනවා.

කොළය පොතක් හැටියට එන්න උපකාර වෙච්ච විදිය, තීන්ත පොතේ ලියවෙන්න උපකාර වෙච්ච විදිය, අකුරු පොතේ පිහිටන්ට උපකාර වෙච්ච විදිය, එකේ වැඩ කරපුකෙනා typist ඒ අකුරු හසුරුවන්න එයා පොතට උපකාර වෙච්ච විදිය. ඊළගට ඒ company එක අයිතිකාරයා උපකාර වෙච්ච විදිය, ඒ printing machine එක උපකාර වෙච්ච විදිය. ඊළගට පත්තර හදපු කන්තෝරුව උපකාර වෙච්ච විදිය බැලුවයින් පස්සේ මේ පොත සකස් වෙන්ට ගොඩක් උපකාරක හේතූන් තියෙනවා උපකාරක ධර්ම තිබෙනවා

හැබැයි ඒ හැම එක්කම උපකාර වෙලා තියෙන්නේ එකම විදියට නෙමෙයි. වෙනස් වෙනස් වෙනස් විදියට. වෙනස් වෙනස් හැඩ වලට. ඒක නිසා ආන්න ඒ විදියට තමන්ට ඔය පට්ඨානය කියන වචනය ඇහුණාම 'ආ ඔය කියන්නේ මෙහෙම මණ්ඩියක්ගැන හිතන එකක්ය - කරුණු ගානක් ගැන හිතන එකක්ය' කියල තේරුම් ගන්නට ඒ වචනය ඇහෙන කොට ඒ පින්තූරය අපේ හිතේ ඉස්සරහ නිකං මේසේ දිග හැරිය වගේ තියෙන්න ඕන. අන්න ඒක පට්ඨානය තේරුම් ගැනීමක්. මම මේ පින්වතුන්ට මතක් කරනවා තවත් ඔයවගේ 'මට සවාමීන් වහන්ස හිතෙන්නේ මේ විදියටයි පට්ඨානය' කියලා කියන්න පුලුවන්නං හොදයි කියල මෛත්‍රීයෙන් මතක් කරනවා.

<u>ප්‍රශ්නය</u> - ඔය සූවිසි ප්‍රත්‍යයයෙම සඳහන් වෙන්නේ මේ ලෝකය සකස් වෙන හැටි එහෙම නැත්නම් දුක සකස් වෙන හැටි විස්තර කරන්නද කියල. තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස.

<u>පිළිතුර</u> - ඒකත් හරි වටිනවා. ඒකේ උපකාරක ධර්‍ම වශයෙන් බැලුවයින් පස්සේ සමහර ඒවා දුක සකස් වෙන්ටත් හේතු වෙනවා ප්‍රත්‍යය වෙනවා හබැයි දුකෙන් එතර වෙන්නත් හේතු වෙනවා ප්‍රත්‍යය වෙනවා. ඒක නිසා මම බොහොම කරුණාවෙන් අපේ හැම එක්කෙනාටම අපේ කොග්ගල මහත්තය කිව්වා වගේ මෙන්න මේ හතර මතක් කරන්න කැමතියි. බලන්ට හරි වටින අදහසක් එතුමා ඉදිරිපත් කරේ. අපි පට්ඨානය ගැන කථා කරන්න උපකාර කර ගත්ත ධර්‍ම මණ්ඩි ප්‍රධාන වශයෙන් හතරක් තිබෙනවා ප්‍රඥප්තියත් එක්ක 5 ක් තියෙනවා. ඒ ප්‍රධාන ගොඩවල් හතරේ බලන්න 'සිත' තියෙනවනේ. එකේ චෛතසික ගොඩකුත් තියෙනවනේ. එකේ රූප ගොඩක් තියෙනවා - එකේ නිර්වාණයත් තියෙනවා. එතකොට ප්‍රත්‍යය ධර්‍ම කථා කිරීමේදී නිර්වාණයත් කථා කරනවනේ - නිර්වාණ ධාතුව. ප්‍රඥප්තියත් කථා කරනවා - ඒක නිසා මේකේ ප්‍රත්‍යය ධර්‍මයන් ගැලපීමේදී ලෝකය සකස් වීමටත් හේතුවන ප්‍රත්‍යයවන විදිය සාකච්ඡා කරනවා - නිර්වාණ ධාතුව අවබෝධ කරගන්ට එතෙර වෙන්ට යන විදිය ගැන - හේතු වෙන විදිය -ප්‍රත්‍යය වෙන විදියත් කථා කරනවා සාකච්ඡා වෙනවා. දැන් නිර්වාණ ධාතුව අරමුණු වෙනවනේ. යම් කිසිවෙලාවක නිර්වාණ ධාතුව අවබෝධ වන විට දුකෙන් නිදහස් විමක්නේ වෙන්නේ. එතකොටත් නිර්වාණ ධාතුව ආරම්මණ ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා, ඒවත් සාකච්ඡා වෙනවා. ඒක නිසා එගොඩයි මෙගොඩයි දෙගොඩම ගැන කථා කරන ධර්‍ම සමූහයක් තමයි මේ. තෙරුවන් සරණයි.

තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස බොහොම පිං

<u>අසන්නෙකුගේ පැහැදිලි කිරීමක්</u> - තෙරුවන් සරණයි ස්වාමීන් වහන්ස, මම උනන්දුවෙන් අහගෙන හිටිය ස්වාමීන්වහන්ස මුල ඉදන්ම. මට එක දෙයක් තේරුනේ ඔබ වහන්සේ අභිධර්මයේ තිබෙන වටිනාකම සඳහන් කරා මුලින්ම. ඔබ වහන්සේ සඳහන් කල පරිදිම අභිධර්මය නැතුව නිවන් දකින්න බැහැ කියන කාරණාව ඇත්ත වශයෙන්ම මට හිතට වැටහුණු කාරණයක් මොකද අපි වචන වශයෙන් කථා නොකරට අපි සූත්‍ර පිටකය හදාරන විටත් අපි ඇත්ත වශයෙන්ම කථා කරලා තියෙන්නේ අභිධර්මය කියන දේ නේද කියල මට හිතට අවා. මොකද උදාහරණයක් වශයෙන් අපි **'චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං. තිණ්ණං සඞ්ගති ඵස්සො'** කියල කථා කරනවා. එතකොට අපි එතනදීම් චිත්ත චෛතසික රූප නිබ්බාන ගැන කථා කරනවා. එතකොට අපි වචන වශයෙන් කථා නොකලට අපි හැම වෙලේම අභිධර්මයෙන්මයි මේ දේවල් ඉගෙන ගන්නේ කියල හිතුන. ඒවගේම මට තව හිතුන දෙයක් තමයි ස්වාමීන්වහන්ස බොහෝ වෙලාවට අමතක වෙන දෙයක් තමයි අර ඔබ වහන්සේගේ මූලික ධර්ම 5ක් ගැන සඳහන් කරා. චිත්ත චෛතසික රූප නිර්වාණ ධාතුව ප්‍රඥප්තිය කියල. අපිට ගොඩක් වෙලාවට මේ ප්‍රඥප්තියේ තියන වැදගත්කම අමතක වෙනවා. අපි මේ අද කථා කල හැම දෙයක්ම කථා කලේ ප්‍රඥප්තියෙන්. ප්‍රඥප්තිය නැතුව අපිට මේ කිසිදෙයක් වටහා ගන්නත් බෑ. ඔබ වහන්සේ කියන දෙයක් අපිට තේරෙන්නෙත් නෑ. අපේ අදහස් ප්‍රකාශ කිරීමට මේ ප්‍රඥප්තියේ තියන වටිනාකම කොතෙක්ද කියන එක මට තේරුම් ගියා. මම හිතනවා මම මේ හිතපු හැටි හරි කියල ස්වාමීන්වහන්ස. ඔබ වහන්සේට අනේක වාරයක් පිං අපිට මේ සරල උදාහරණ අරෙගන මේ ප්‍රත්‍යය ධර්ම බුදුකෙනෙකුට විතරක්ම අවබෝධ කරන්න පුළුවන් වන මේ ඉතාම ගැඹුරු ප්‍රත්‍යය ධර්මයට අපිට මේ විදියට සරල ලෙස ප්‍රවිශ්ටයක් ලබාදීම පිළිබඳ ඔබවහන්සේට අනේක වාරයක් පිං දෙනවා.

<u>ප්‍රශ්නය</u> - අවිද්‍යාව නැති තැන මේ ප්‍රත්‍යය තිබෙයිද?

<u>පිළිතුර</u> - අවිද්‍යාව නැති තැන කියන එක දෙවිදියකට ගන්න පුළුවන්. නිර්වාණ ධාතුව අවබෝධ කරගත්තහම අවිද්‍යාව නැහැ සහ අවිද්‍යාව නැති වෙච්ච තැන තියෙන්නේ විද්‍යාව නේ. එතකොට ඒක ප්‍රඥාව වෙනවනේ. එතකොට ඒක එකක්. දැන් ඔය ප්‍රත්‍යය ධර්ම කථා කිරීමේදී අපිට ඉස්සරහ තැනක් එනවා. එතනදී අපිට කථා කරන්න පුළුවන් අවිද්‍යාවත් එක හේතුකාරක ධර්මයක් වෙනවා මේ ධර්ම හැදෙන්ට. අනිත් එක තමයි අවිද්‍යාව කියන එකේ අනිත් පැත්ත ගත්තයින් පස්සේ විද්‍යාව. විද්‍යාව කියන එකත් හේතුවක්, උපකාරක ධර්මයක් වෙනවා යම් යම් දේවල් සකස් වෙන්න. ඊළගට නිර්වාණ ධර්මය

අවබෝධ කර ගැනීමට ගියාට පස්සෙත් ඕක හේතු වෙනවා. අපිට මේ ගැන ඉදිරියේදී යම් යම් තැන්වලදී ඉගෙන ගන්න ලබෙනවා. හැබැයි මම මහන්සි ගන්නේ පුළුවන් තරම් මූලික කරුණු ටික මේ පින්වතුන්ගේ හිත්වල තැන්පත් කරන්න. එතකොට තමයි, දැන් නූල් බෝලයක් තියෙනවානම් ඉදිකට්ටක් තියෙනවානම් මොකක් හරි මහන්න දේකුත් තියෙනවාම් එතකොට නූලුත් දාල ඉදිකට්ටෙන් මහන්න පුළුවන්. එතකොට අපිට අවශ්‍ය කරන්නාවූ tool set එක තිබුනොත් එහෙම ඊට පස්සේ අපිට ගලපල ගලපල බුදුරාජාණන් වහන්සේ දේශනා කරපු න්‍යාය අනුගමනය කරමින් අපිට ඊට පස්සේ යොදල සකස් කරන්න පුළුවන්. දැනගන්න පුළුවන්. බුදුරාජාණන් වහන්සේත් සැරියුත් ස්වාමීන්වහන්සේට ඉදිරිපත්කරා කියල කියනවනේ න්‍යායක් මෙන්න මේ ක්‍රමයට බලන්න කියල. ඊට පස්සේ ඒ ක්‍රමයට තමයි ඒ ස්වාමමීන් වහන්සේ මේක දිග හැරියේ. එකේ දිග හැරපු ටික තමයි අපිට තියෙන්නේ. ඉස්සරහට ඒකත් දැන ගන්න පුළුවන්. අවිද්‍යාවෙන් තොර වෙච්ච තැන ඔය ඔක්කෝම ටික හලන්නත් පුළුවන්. ඒවගේම තමයි අවිද්‍යාවෙන් තොර වෙච්ච අනිත් පැත්ත හේතු වෙන හැටි බලන්නත් පුළුවන්. තෙරුවන් සරණයි.

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස අවසරයි - පොදුවේ බලන කොට දැන ගන්න දෙයක් සිහිඋනා . දැන් අපි නිවන ඇරෙන්න චිත්ත චෛතසික රූප ප්‍රඥප්ති යන සේරම මම හිතන්නේ සංඛත ගොඩට දානවා නිවන අසංඛත ධාතුව විදියට සඳහන් වෙනවා. එතැන සංඛත කියන කොට හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් උනා කියන ස්වභාවයත් අසංඛත කියන කොට එහෙම නොවන ස්වභාවයක් සලකන කොට නිවන ඇරෙන්න ඉතුරු ධර්ම තාවලට නේද මේ අපට හේතු ප්‍රත්‍යය ගැන කථා කරන්න පුළුවන් කියල හිතුන. අර අනිත් මහත්තය ‘අවිද්‍යාව තියෙනකම් විතරද සුවිසි ප්‍රත්‍යය යෙදෙන්නේ, අසංඛත ධතුවෙහිදී කථාවක් නැත්ද’ කියන අදහස ගැන ඔබ වහන්සේ කරුණාවෙන් පැහැදිලි කරණවානම් බොහොම වටිනවා. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - හරි වටිනවා ඒක. මෙහෙම තියෙනවා, හේතු ප්‍රත්‍යය කථා කිරීමේදී දේශනාවේ අපිට අවස්ථා තුනක් මතුවෙනවා. හේතු ඵල ගැන කථා කරපු අවස්ථා තුනක් එනවා. එකෙන් පළවෙනිම හේතු ඵල ධර්මයන්ගෙන් හටගන්න දේවල් ගැන කථා කරපු තැන තමයි **‘ධම්ම චක්ක පවත්වන සූත්‍රය’**. එකේ තියනවා හතර ගොඩක්. ඒක තියෙන්නේ මෙහෙමයි. දුකට හේතුව සමුදය එනම් තණ්හාව කියල තියෙනවා. නිවන එකක්, ඒකට යන මාර්ගය හේතුවක් හැටියට දක්වල තියෙනව. ඔය ගොඩවල් හතරකට දාල මුළු සංඛත ධර්මයෝ අසංඛත ධර්මයෝ හතර ගොඩකට දාල බුදු රජාණන්වහන්සේ දේශනා කරනවා. ඊළඟට සැරියුත් ස්වාමීන්වහන්සේට ඔය හතර බාර දුන්නයින්

පස්සේ සැරියුත් ස්වාමීන්වහසේ වැඩි ගාම්භීර පැත්තකට යන්නෙත් නැතුව ලෝකයේ ඉන්න මිනිස්සුන්ගේ සම්මුති වටපිටාවත් හොඳට ලංකරගෙන සම්මුති වටපිටාවේ පිහිටලා මිනිස්සුන්ට එපා නොවෙන තාලෙට උන්වහන්සේ සච්ච විභංග සූත්‍රයේ දේශනා කරනවා ඔය චතුරාර්ය සත්‍ය. එතකොට කියනවා **'ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛනධානං පතුභාවො ආයතනානං පටිලාභො'**යනුවෙන් ඔය විදියට ලස්සනට කියාගෙන යනවා. ඔන්න දැන් උප්පත්තිය. උපත්තිය හටගන්න විදිය ඊටපස්සේ එකේ සමුදය තුනකට කියල තියෙනවනේ. **'කාම තණ්හා' 'භව තණ්හා' 'විභව තණ්හා'** වශයෙන්. දුඛ ඊට පස්සේ විස්තර කරන තාලේ. දැන් මරණය විස්තර කරන තාලේ, ජරාව විස්තර කරන තාලේ , සෝකය විස්තර කරන තාලේ, දැන් බලන්න සම්මුතිය ඉක්මවා යන්නේ නැතුව සම්මුති පැකට් එකේම තියාගෙන අර හිත් වලට මේක දාන තාලේ. ඔන්න ඔය හතර දේශනා කරපු විදිය. ඔන්න එකක්.

දෙක තමයි හේතුව සහ ඵලය දක්වන්ට භාවිතා කරපු **'පටිච්චසමුප්පාද න්‍යාය ක්‍රමය'**. පටිච්ච සමුප්පාද න්‍යාය ක්‍රමයේදී - මේ හේතුව නිසා මේක ලඟම එක - මේ හේතුව නිසා මේ ඊළඟ එක යන විදියට කරුණු 12 එක්කාසු කරගෙන ඒ ටිකේ කරකවනව හේතු ඵල ධර්ම සමූහය. ඒකත් ඇත්ත වශයෙන්ම බැලුවට පස්සේ ප්‍රත්‍යය වීමක් තියෙනව. හේතු වීමක් ප්‍රත්‍යය වීමක් එකේ තියෙනවා. ඔය මධ්‍යම විදියට කියනවා. ඒ දෙකේම තියෙනවා මෙන්න මෙහෙම තැනක්. බලන්ට **'සඞ්ඛිතෙතන පඤ්චුපාදානකඛනධා දුක්ඛා'** කියල කියනවා. ඊළඟට පටිච්චසමුප්පාදය කියන තැන අවසානයේදී කියනවා **'ජාති පච්චයා ජරා මරණං සෝක පරිදේව දුක්ඛ දෝමනස්සපුයාවාසා සම්භවන්තී එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයෝ හොති'** යනුවෙන් එතනත් දුක්ඛසකන්ධයන්ගේ ඇතිවීම නම් කරනවා.

දැන් එනවා අපි තුන්වෙනි තැනට. පළවෙනි එක ධම්ම චක්ක පවත්තන සූත්‍රය, දෙවෙනි එක පටිච්ච සමුප්පාද විග්‍රහය, තුන්වෙනි එක මෙතෙන්ට එන්නේ හේතු ප්‍රත්‍යය. ඔතන කථා කරන දේවල් සංඛතයි අසංඛතයි ඔක්කොම ටික මිශ්‍ර කරලා තමයි ධර්ම හැටියට කිසිම එකක් අත හරින්නේ නැතුව - ලොකු හේතු, පොඩි හේතු, ලඟ හේතු, දුර හේතු, මහ හේතු, කුඩා හේතු, දිග හේතු, කොට හේතු ඔක්කොම ටික දාල කථා කරනවා. එතනදී ඔය දුඛ්‍ය සත්‍ය කියන කථාවවත් මොනවාක්වත් කියන්නේ නැහැ. සමුදය සත්‍ය කියල මොනවක්වත් කියන්නේ නැහැ. යම් කිසි දෙයක් ඇතිවෙන්න උපකරවන්නාවූ ධර්ම සවභාවයෝ මෙහෙමයි කියන එක දිග අරිනවා. දැන් අපේ මහත්තය මතක් කරපු විදියට චිත්ත චෛතසික රූප ටික ගත්තහම ඔය ටික හැදෙන්නේ ඇත්ත වශයෙන්ම හේතු වලින්නේ. සංඛත ධර්ම නේ. දැන් නිර්වාණ ධාතුව

අසංඛතයිනේ. ප්‍රඥප්තියත් අසංඛතයි. ලෞකිකඅසංඛත ධර්ම දෙකක් ගැන කියවෙනවා, එකක් තමයි ප්‍රඥප්තිය. ප්‍රඥප්තිය ඇතිවන්නේ හේතු ඵල ධර්ම වලින්වත් නැත්නම් ඒක දිරාපත් වනවා කියලවත් එහෙම අනිත්‍ය දුක්ඛ අනාත්ම ලක්ෂණ ඕකෙ පහළ කරවන්ට බෑ. අනිත් එක තමයි ආකාශ ධාතුව. ආකාශ ධාතුවයි ප්‍රඥප්ති ධර්මයයි දෙක ලෞකික වශයෙන් කථා කරන්න පුළුවන් අසංඛත ධර්ම දෙකක්. හැබැයි ඒකෙ අර නිර්වාණ ධාතුවේ වගේ නිච්ච්ච ගතියක් පෙන්නුම කරන්නේ නෑ. ඒ උනාට නිර්වාණ ධාතුව අසංඛතයි. හැබැයි බලන්ට මේ ටික ඔක්කොම නිර්වාණයත් කථා කරනවා, ප්‍රඥප්තියත් කථා කරනවා, අසංඛත ධර්මත් කථා කරනවා. දැන් අපි හිතමු මෙහෙම - රහතන් වහන්සේ ඵල සිත් උපකාර කරගෙන නිර්වාණ ධාතුව අරමුණු කරනවා. අරමුණු කරන වෙලාවේදී එකේ තියෙනවනේ නිර්වාණ ධාතුව ආරම්මණ විදියට ප්‍රත්‍යය වන ගතියක්. නිර්වාණ ධාතුවේ අරමුණු ස්වභාවය එහෙම නැත්නම්, ඒ ඵල සිත් වලට පේන්න විදියක් නැනේ - දැනෙන්න විදියක් නැනේ. ආන්න ඒකේ එතකොට තියෙනවා, හේතු ප්‍රත්‍යය ධර්ම කථා කිරීමේදී බුදුරාජාණන්වහන්සේ අඩුවක් නැතුව කථා කරනවා. තවත් වචන කීපයක් කියනවා. මම අවසානයේදී ගිය දුර ප්‍රමාණය වැඩි දෝ කියලත් හිතෙනවා. එහෙම උනොත් කෙනෙකුට අමාරුයි කියල හිතෙන්න පුළුවන්.

බුදුරාජාණන් වහන්සේගේ දේශනාවේ කොට්ඨාශ දේශනාව තියෙනවා. ඒවගේම ශේෂ කරලා දේශනා කරලා තිබෙනවා. මේක ඇවිල්ල නිරවශේෂ දේශනාවක්. ඒ කියන්නේ ආයිත් ඉතුරු නැතිවම කරන්නාවූ දේශනා වලට කියනවා නිරවශේෂ ධර්මදේශනා කියල. මේ අභිධර්මයේත් තියෙන්නේ හේතු, සංඛත අසංඛත ඔක්කොම එක්කාසු කරලා ඒවා එකට එකට ධර්මසවභාව හැටියට උපකාරවෙන විදිය කියනවා කියන එක තමයි කියන්නේ.

තව එකක් පටලවා ගන්න එපා, එකක් තමයි යම් කිසි දෙයකින් ඒක හේතුවක් වෙලා ඒක මාතෘත්වය ඒක පිතෘත්වය වගේ පිහිටලා ඒකේ ඵලයක් හැටියට දෙයක් මතුවීම කියන එකයි - යම් කිසි දෙයක් තවත් එහෙකට පොඩී උපකාරක පෙනී හිටීමක් වශයෙන් සිද්ධ වෙනවා කියන එකයි **දෙකක්**. මේ ප්‍රත්‍යය ධර්ම කථාවේදී සිද්ධ කරන්නේ යම් කිසි හේතුවකින් හටගත්තා කියන එකට වඩා යම් කිසි දෙයක් සිදුවෙන්ට මෙන්න මෙහෙම උපකාරක ස්වභාවයෙන් මෙහෙම ධර්මයක් මෙහෙම පිහිට වෙනවා කියන කථාවයි. ඒක නිසා **'පච්චය'** කියන වචනය බහුලව පාවිච්චි කරලා තියෙනවා මේකේ. ඒක

නිසා ඒක මතක තියා ගත්තොත් හොඳයි කියල මම කරුණාවෙන් මතක් කරනවා. තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු! ගෞරවණීය ස්වාමීන්වහන්ස අපි මේ වෙලාවේ අද සච්ඡාව මෙතනින් නිමා කරනවා. අද දවසේ අපිට උතුම් මාර්ගයක් උදා උනේ. 2017 වර්ෂයේදී සුවිසි ප්‍රත්‍යය ධර්ම පිළිබඳව ඉගෙන ගැනීම අද දවසේ ඇරඹුනා. අද දවසේ සම්බන්ධ උන සියලුම කල්‍යාණ මිත්‍රයනුත් ඒවගේම ගුවන් විදුලියට සවන් දෙන සියලුම කල්‍යාණමිත්‍රයන් වෙනුවෙනුත් අපි මේ සියලුම ධර්ම දේශනා YouTube සහ සවනට සිසිලස වෙබ් අඩවිය තුලිනුත් කවදා හෝ මේවා download කරලා ශ්‍රවණය කරන පිංවතුන් වෙනුවෙනුත් කල්‍යාණමිත්‍රයන් වෙනුවනුත් පූජ්‍ය පාද ජිනාලංකාර ගෞරවණීය ස්වාමින්වහන්සේට අපි නමස්කාර කර සිටිනවා. උන්වහසේ පතනා බෝධියකින් පූර්ණ වශයෙන්ම ප්‍රඥාව පහළ වීමෙන් සසර නිමා කරගැනීමට උන්වහසේට මෙම ධර්ම දානයම පුණ්‍ය ක්‍රියාව හේතුවක් වේවා කියල ප්‍රාර්ථනා කර සිටිමු. එහෙමනම් මම ඉතාම ගෞරවයෙන් ඔබවහන්සේට යොමු වෙනවා ස්වාමීන්වහන්ස අද දවසේ ධර්ම දේශනාව මේ ආකාරයට නිමා කරන ලෙසට.

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි පින්වත්නි සැම දෙනාටම තෙරුවන් සරණයි, අපේ මේ පුංචි හිත් වලින් ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ ධර්මය අතපත හගන්න යන වෙලාවක් මේ. ඉතිං අපි හැම එක්කෙනාටම, ධර්ම පිපාසය තියෙන අයට ඒ හිත් වලට අවශ්‍ය කරන්නාවූ ධර්ම කොට්ඨාසයක් කෙරෙහි ගෞරව ඇතිව සැරියුත් මහා හිමිපාණන්වහන්සේ කෙරෙහි ගෞරව ඇතිව අපි ඒ හිත් වලට ස්පර්ශ කරවීමක් මේ කරන්නේ - අපිට දැනෙන අපිට පුළුවන් විදියටයි. ඉතිං ඒක නිසා මේ පින්වතුන්ට ඒ ධර්මය තවත් ඉතිං ඉස්සරට යනකොට තේරුම් ගන්න පුළුවන් වෙයි කියල අපි විශ්වාස කරනවා. මේ ධර්ම කාණ්ඩ හිත් වලට ඇතුල් කිරීමේදී සහ ස්පර්ශ කිරීමේදී, කාටහරි මනුෂ්‍යකුට වතුර පිපාසයක් තිබෙනවා. .................. ඉතුරු ටික පටිගත වී නොමැත.

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.